# සේවක ඡන්ද වරම කැපූ හාම්පුතුන් පහක් ගැන පැමිණිලි

06/08/2020

•උදයජීව ඒකනායක

•සාලිය කුමාර ගුණසේකර

සේවකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව ලබා නොදුන් ආයතන පහක් පිළිබඳ පැමිණිලි ලැබී ඇතැයි පැෆරල් සංවිධානය සඳහන් කරයි.

මෙම ආයතන පහ අතර වරායට සම්බන්ධ ආයතනයක්ද තිබෙන බව එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි කීවේය.

ඇතැම් ඇඟලුම් කම්හල්වල පාලනාධිකාරිය විසින් සිය සේවක සේවිකාවන්ට ඡන්දය ලබා දීමට ගම්බිම් බලා යෑමට අවස්ථාව ලබා නොදුන් බවට පැමිණිලි ලැබුණු බවත්, ඒ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාවට පැමිණිලි කිරීමට කටයුතු කළ බවද ඔහු පැවසුවේය. සිය ගම්වලට ගොස් ඡන්දය ප්‍රකාශ කර නැවත පැමිණෙන්නේ නම් පී.සී.ආර්. පරීක්ෂණයක් සිදුකරගෙන පැමිණෙන ලෙසට වරායට සම්බන්ධ ආයතනයකින් සේවකයන්ට දැනුම් දී ඇති බවටද පැෆරල් සංවිධානයට පෙරේදා (04 වැනිදා) පැමිණිල්ලක් ලැබී තිබිණි.